# කොන්සියුලර් ප්‍රකාශ නිකුත් කිරීම (Consular Declaration)

| | |
|---|---|
| 1 | සම්පූර්ණ කරන ලද පසු පිට සඳහන් ඉල්ලුම් පත්‍රය |
| 2 | ඉල්ලුම්කරුගේ වලංගු ගමන් බලපත්‍රය හා එහි ඡායා පිටපතක් |
| 3 | ඉල්ලුම්කරුගේ උප්පැන්න සහතිකයේ මුල් පිටපත හා එහි ඡායා පිටපතක් (ඉංග්‍රීසි පරිවර්තනයක් සමග ) |
| 4 | ඉල්ලුම්කරු විවාහක නම් ඒ බව තහවුරු කිරීම සඳහා විවාහ සහතිකයේ මුල් පිටපත හා එහි ඡායා පිටපතක් (ඉංග්‍රීසි පරිවර්තනයක් සමග ) |
| 5 | ඉල්ලුම්කරුගේ කලත්‍රයා හා දරුවන්ගේ තොරතුරු ඇතුලත් කර අයදුම් කරන්නේ නම් ඔවුන්ගේ වලංගු ගමන් බලපත්‍ර හා එහි ඡායා පිටපත් ද උප්පැන්න සහතික වල මුල් පිටපත් හා එහි ඡායා පිටපත් (ඉංග්‍රීසි පරිවර්තනයන් සමග ) |
| 6 | ඉල්ලුම්කරුගේ ඉතාලි හැඳුනුම් පත (carta d'identità) හා ඡායා පිටපතක් (ඉතාලි ලිපිනය තහවුරු කිරීම සඳහා) |
| 7 | ගාස්තුව - යුරෝ 16.00 |

විවාහ සහතිකය හා උප්පැන්න සහතික කොළඹ විදේශ කටයුතු අමාත්‍යාංශයේ කොන්සියුලර් අංශයෙන් සහතික කොට ඉදිරිපත් කල යුතුය.

කොන්සියුලර් ප්‍රකාශනය සඳහා ඉල්ලුම්කරුගේ ඉතාලි ලිපිනය ඇතුලත් කිරීමට ඉල්ලුම්කරුගේ ඉතාලි හැඳුනුම් පත (carta d'identità) හා එහි ඡායා පිටපතක් ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ. ශ්‍රී ලංකාවේ පදිංචි ලිපිනය ඇතුලත් කිරීමට ඉල්ලුම්කරු නමින් පුද්ගලයින් ලියාපදිංචිකිරීමේ දෙපාර්තමේන්තුව නිකුත් කල ජාතික හැඳුනුම්පත හෝ ශ්‍රී ලංකාවේ පදිංචි ලිපිනය තහවුරු කර කොළඹ විදේශ කටයුතු අමාත්‍යාංශයේ කොන්සියුලර් අංශයෙන් සහතික කොට ලබාගත් ලිපියක් ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ.

කොන්සියුලර් ප්‍රකාශන ලබාගැනීමේ දි ඉදිරිපත් කරනු ලබන සියලුම උප්පැන්න සහතික/විවාහ සහතික හා මරණ සහතික මුල් පිටපත් ඉදිරිපත් කල යුතු අතර කොන්සියුලර් ප්‍රකාශ හා පරිවර්තන කටයුතු වලට ඉදිරිපත් කරනු ලබන සියලුම සහතික කොළඹ විදේශ කටයුතු අමාත්‍යාංශයේ කොන්සියුලර් අංශයෙන් සහතික කොට (2011 ඔක්තෝබර් 15 දිනට පසුව) ඉදිරිපත් කිරීම අනිවාර්යය බව කාරුණිකව දැනුම් දෙමි.